**නැගෙනහිර පළාත් සභාව**

**---------------------------**

නැගෙනහිර පළාත් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කෙරේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

**-------------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1** **මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම**

**(අ)** **පළාත් සභා අරමුදල පිළිබඳ මූල්‍ය ප්‍රකාශන**

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභා අරමුදල පිළිබඳ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 18 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**(ආ)** **වෙනත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2015 මැයි 31 දිනට සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභාවේ අනෙකුත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | ගිණුම් වර්ගය | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කරන ලද ගිණුම් සංඛ්‍යාව | 2015 මැයි 31 දිනට ඉදිරිපත් නොකරන ලද ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | විසර්ජන ගිණුම් | 33 | 33 | - |
| (ii) | ආදායම් ගිණුම් | 02 | 01 | 01 |
| (iii) | පළාත් රාජ්‍ය නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් | 33 | 32 | 01 |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 06 | 02 | 04 |
| (v) | අරමුදල් ගිණුම් | 02 | 01 | 01 |
| (vi) | ව්‍යවස්ථාපිත ගිණුම් | 02 | 01 | 01 |
| | එකතුව | 78 | 70 | 08 |

(ඇ) 2010 අංක 1 දරන නැගෙනහිර පළාත් පෙර පාසැල් අධ්‍යාපන කාර්යාංශ පනතේ 9(2) වගන්තිය ප්‍රකාරව නැගෙනහිර පළාත් සභාවේ පෙර පාසැල් අධ්‍යාපන කාර්යාංශයේ 2013 හා 2014 වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන 2015 අගෝස්තු 31 දක්වාත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) නැගෙනහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදලේ 2013 හා 2014 වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන පළාත් මුදල් රීති 258 ප්‍රකාරව 2015 අගෝස්තු 31 වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) 2013 හා 2014 වර්ෂ සඳහා නැගෙනහිර පළාතේ ඒකාබද්ධ හිඟ ආදායම් ගිණුම් පළාත් මුදල් රීති 258 ප්‍රකාරව 2015 අගෝස්තු 31 වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.2 විසර්ජන ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම්**

-----------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ශීර්ෂ 19 ක වියදම් විෂයයන් 59 ක් යටතේ කරන ලද එකතුව රු.30,114,650 ක් වූ සමස්ත ශුද්ධ ප්‍රතිපාදනය වැය නොකර පැවතුණි.

(ආ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ශීර්ෂ 13 ක වියදම් විෂයයන් 68 ක් යටතේ රු.44,331,891 කින් ප්‍රතිපාදනය ඉක්මවා බැරකම් වලට බැඳී තිබුණි.

(ඇ) 2015 ජනවාරි 30 දිනැති අංක පීටී/02/2015 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ පළාත් අමාත්‍යාංශ 04 ක් හා දෙපාර්තමේන්තු 07 ක් විසින් ප්‍රාග්ධන වියදම් සඳහා වැය කරන ලද එකතුව රු.247,006,215 ක් ජංගම නොවන වත්කම් සංචලනය යටතේ විසර්ජන ගිණුම්වල දක්වා නොතිබුණි.

**2.2.3 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

---------------------------------------

පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 21 ක එකතුව රු.51,441,155 ක් වූ සේවක ණය ශේෂයන් වර්ෂ 02 සිට 10 දක්වා කාල පරිච්ඡේදයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි. මෙම අයකර නොගත් ශේෂ තුළ පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 12 ක නිලධාරින් මාරුවීම මත ලැබිය යුතු එකතුව රු.46,247,034 ක් වූ ශේෂ, මියගිය, විශ්‍රාම ගිය නිලධාරින් හා සේවය අතහැර ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු එකතුව රු.4,176,641 ක් වූ ශේෂ හා පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරුන් 20 දෙනෙකුගෙන් ලැබිය යුතු එකතුව රු.1,017,480 ක් වූ ශේෂ ඇතුළත්වී තිබුණි.

**2.2.4 අග්‍රිම ගිණුම්**

-------------

සියලුම අග්‍රිම ඊළඟ මුදල් වර්ෂයේ පළමු වැඩ කරන දිනයේදීම පළාත් භාණ්ඩාගාරයට ආපසු යැවිය යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.6,486,095 ක් වූ දෙපාර්තමේන්තු 03 ක අග්‍රිම ශේෂ 2015 අගෝස්තු 20 දක්වා පළාත් භාණ්ඩාගාරයට ආපසු යවා නොතිබුණි.

**2.2.5 පොදු තැන්පත් ගිණුම**

---------------------

අමාත්‍යාංශ 02 කට හා දෙපාර්තමේන්තු 12 කට අදාළව එකතුව රු.78,941,796 ක් වූ තැන්පතු වර්ෂ 2 කට වැඩි කාලයක් පැවතුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පළාත් මුදල් රීති 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.2.6 වාණිජ අත්තිකාරම් ගිණුම්**

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු 06 කින් වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු 03 ක් වර්ෂ 6 කට වැඩි කාලයක් ක්‍රියාත්මකව නොතිබුණි. කෙසේ වුවද එම වානිජ අත්තිකාරම් ගිණුම් කටයුතු 03 වසා දැමීමට පළාත් මුදල් රීති 286 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අම්පාර, පේෂ කර්මාන්ත විකුණුම් මධ්‍යස්ථානයේ 2015 මැයි 13 දින සිදුකරන ලද භෞතික පරීක්ෂණයේදී රු.316,132 ක් වටිනා රෙදිපිළි තොගයක ඌනතාවයක් නිරීක්ෂණය විය. කෙසේ වුවද රෙදිපිළි ඌනතාවය සඳහා වගකිව යුතු නිලධාරියාට එරෙහිව ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් පියවර ගෙන නොතිබුණි.
රෙදිපිළි ඌනතාවය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---|
| තොග ලේඛනයට අනුව විකුණුම් මධ්‍යස්ථානයේ හා ගබඩාවල තිබූ තොගයේ වටිනාකම | 1,881,047 |
| අඩුකළා - භෞතික පරීක්ෂණයට අනුව අම්පාර විකුණුම් මධ්‍යස්ථානයේ හා ගබඩාවල තිබූ රෙදිපිළිවල වටිනාකම | 1,564,915 |
| | ------------- |
| ඌනතාවයේ වටිනාකම | 316,132 |

## 2.2.7 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් එකතු කිරීමට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට පාලන ආයතන වලට ගෙවිය යුතු රු.783,645,847 ක මුදලක් ගිණුම්ගත කර නොතිබුණි. එබැවින් 2014 දෙසැම්බර් 31 දිනට මුළු බැරකම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) රු.1,343,559,003 ක් වූ පෙර වර්ෂය අවසානයට සමුච්චිත අරමුදලේ ශේෂය සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු.2,002,133,322 ක් ලෙස ඉදිරියට ගෙනැවිත් තිබුණි. කෙසේ වුවද සමුච්චිත අරමුදලේ ශේෂයේ වෙනස පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ තැන්පතුවල ශුද්ධ වැඩිවීම රු.25,052,490 ක් විය. කෙසේ වුවද තැන්පතු වලින් මුදල් ගලාඒම ලෙස රු.549,117,952 ක මුදලක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි. එබැවින් තැන්පතු වලින් මුදල් ගලා ඒම රු.524,065,462 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් අයකර ගැනීමේ ශුද්ධ වැඩිවීම රු.802,929 ක් විය. කෙසේ වුවද ඉහත සඳහන් මුදල් ගලාඒමේ වටිනාකම රජයේ නිලධාරින්ගෙන් අත්තිකාරම් අයකර ගැනීමේ මුදල් ගලා යාමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එබැවින් රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් වලින් මුදල් ගලා ඒම රු.1,605,858 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) පළාත් සභාවට අයත් විවිධ වර්ගයේ වාහන 620 ක් අගය කර ගිණුම්ගත කර නොතිබුණි.

## 2.2.8 පැහැදිලි නොකළ වෙනස්කම්

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තැන්පතු ගිණුමට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය සහ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යන වාර්තාවල දැක්වෙන ශේෂය අතර රු.17,549,097 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2014 වර්ෂය සඳහා මුළු පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් ශේෂයට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය හා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් පවත්වා ගෙන යන ලද වාර්තාවල දැක්වෙන ශේෂය අතර රු.1,579,027 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.9 විගණනය සඳහා සාක්ෂි නොවීම**

(අ) සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය සඳහා නිකුත් කරන ලද විගණන විමසුම් 07 ක් සඳහා පිළිතුරු 2015 සැප්තැම්බර් 15 දක්වා ඉදිරිපත් කර නොතිබුණු අතර එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.5,953,812 ක් විය.

(ආ) පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | මුදල | විගණනයට ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් | 38,467,833 | ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය |
| වාහන | 110,572,807 | ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා, |
| ලී බඩු හා කාර්යාල උපකරණ | 283,456,871 | |
| පිරියත, යන්ත්‍ර හා උපකරණ | 148,267,388 | |
| ගොඩනැගිලි හා ව්‍යුහයන් | 1,444,686,582 | |
| වෙනත් ජංගම නොවන වත්කම් | 39,834,175 | |
| | 2,065,285,656 | |

**2.2.10 නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවීම**

විගණන නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවීම් අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| (i) මුදල් රෙගුලාසි 138 | අධ්‍යාපන අමාත්‍යාංශයේ වවුචර් 32 ක් සඳහා සහතික කිරීමේ නිලධාරියාගේ සහතිකය නොමැතිව රු.10,961,634 ක ගෙවීම් සිදුකර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396 | අමාත්‍යාංශ 03 ක් හා දෙපාර්තමේන්තු 12 ක් විසින් නිකුත් කරන ලද රු.1,178,972 ක් වටිනා චෙක්පත් 138 ක් මාස 6 කට වැඩි කාලයක් ගෙවීම සඳහා |

ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද එම ඉදිරිපත් නොකරන ලද චෙක්පත්වලට අදාළව මුදල් රීති ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**(ආ) නැගෙනහිර පළාත් මුදල් රෙගුලාසි**

(i) පළාත් මුදල් රීති 219.2

එක් අවස්ථාවකදී මාණ්ඩලික නිලධාරියෙකුට ගෙවිය හැකි උපරිම තත් කාර්ය අතුරු අග්‍රිමය රු.50,000 කට සීමා වේ. කෙසේ වුවද ක්රීඩා දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 10 කදී උපරිම සීමාව ඉක්මවා එකතුව රු.1,204,650 ක් වූ උප අග්‍රිම ලබාදී තිබුණි.
ලබාදෙන ලද තත්කාර්ය අතුරු අග්‍රිම එම ලබාදෙන ලද කාර්යය අවසන්වූ වහාම පියවිය යුතු වුවත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන ලද එකතුව රු.174,600 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම දින 32 සිට 82 දක්වා වූ කාලයක ප්‍රමාදයන් සහිතව නිරවුල් කර තිබුණි.

(ii) පළාත් මුදල් රීති 326.2

2014 වර්ෂයට අවසානයට ඒකාබද්ධ ස්ථාවර වත්කම් උපයෝජන ප්‍රකාශනය 2015 අප්‍රේල් 30 දිනට හෝ ඊට පෙර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, 2008 සිට 2014 වර්ෂය දක්වා වූ එම ප්‍රකාශන පළාත් සභාව විසින් පිළියෙල කර 2015 අගෝස්තු 20 දක්වාත් ඉදිරිපත් කර නොතිබුණි.

(iii) පළාත් මුදල් රීති 365

අමාත්‍යාංශ 02 ක් හා දෙපාර්තමේන්තු 05 ක් විසින් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ 2015 අගෝස්තු 20 දක්වාත් පවත්වා නොතිබුණි.

(iv) පළාත් මුදල් රීති 437

ලියාපදිංචි කරන ලද දිනයේ සිට වර්ෂ 5 කට වැඩි කාලයක් උපයෝජනය කරන ලද වාහන කුලී පදනම මත ලබා නොගත යුතුය. කෙසේ වුවද සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් ගරු අමාත්‍යවරයා, පුද්ගලික ලේකම්, සම්බන්ධීකරණ ලේකම්, මහජන සම්බන්ධතා නිලධාරි හා පළාත් සභාවේ මන්ත්‍රීවරයකුගේ උපයෝජනය සඳහා සමාලෝචිත වර්ෂය තුළ ලියාපදිංචි කළ දිනයේ සිට වර්ෂ 05 ක් ඉක්මවූ වාහන 04 ක් කුලී පදනම මත ලබාගෙන තිබුණි.

තවද වාහන කුලියට ලබාගැනීම සඳහා උපරිම ගිවිසුම් කාල පරිච්ඡේදය මාස 6 ක් නොඉක්මවිය යුතුය. කෙසේ වුවද කුලී පදනම මත වාහන 06 ක් මාස 12 ක කාලයක් සඳහා ලබාගෙන තිබුණි.

**(ඇ) චක්‍රලේඛ**

**-----------**

| | | |
|---|---|---|
| (i) | 2001 මාර්තු 28 දිනැති අංක 01/2001 දරන පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව, පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ට ණය ලබාදීමේදී ඇපකරුවන් ලෙස අත්සන් කරන පුද්ගලයන් දෙදෙනාගෙන් එක් පුද්ගලයෙකු ආදායම් බදු ගෙවන්නෙකු විය යුතුය. කෙසේ වුවද පළාත් සභාවේ වෙනත් මන්ත්‍රීවරයකු ඇපකරුවකු වශයෙන් ලබාගෙන සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.4,600,000 ක් වූ ණය පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ට ලබාදී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2014 දෙසැම්බර් 31 දිනට රු.1,017,480 ක් වූ ණය ශේෂයන් ආපසු ගෙවීම පැහැර හරින ලද මන්ත්‍රීවරුන් 20 දෙනෙකුට එරෙහිව පියවර ගැනීමට පළාත් සභාවට නොහැකිවී තිබුණි. |
| (ii) | 2013 සැප්තැම්බර් 01 දිනැති අංක එස්ඊසී/2013/07 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | 2013 සැප්තැම්බර් 01 සිට 2014 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය සඳහා මාසික වැටුප් ගෙවීමේදී පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිලධාරීන් දෙදෙනෙකුගේ මාසික වැටුප් වලින් එකතුව රු.119,755 ක් වූ උපයන විට ගෙවීම් බදු අයකර ගෙන නොතිබුණි. |
| (iii) | 2014 නොවැම්බර් 24 දිනැති අංක පීටී/09/2014 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සමාලොචිත වර්ෂය අවසානයට මුදල් පොත පියවීම සඳහා 2015 ජූලි 17 දක්වාත් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි |

**3. ආදායම් කළමනාකරණය**

**----------------------------**

විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව, පසුගිය වර්ෂ 05 තුළ එකතු කරන ලද මුළු ආදායම පහත දැක්වේ.

| විස්තර | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | | |
|---|---|---|---|---|---|
| --------- | **2014** | **2013** | **2012** | **2011** | **2010** |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| බදු ආදායම | 2,181 | 1,860 | 1,496 | 1,354 | 951 |
| බදු නොවන ආදායම | 320 | 288 | 309 | 198 | 224 |
| | --------- | --------- | --------- | -------- | -------- |
| එකතුව | 2,501 | 2,148 | 1,805 | 1,552 | 1,175 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 වර්ෂය සඳහා පළාත් සභාව විසින් පිළියෙල කරන ලද ආදායම් ඇස්තමේන්තුවට අනුව, මත් පැන් බලපත්‍ර ගාස්තු වලින් ඇස්තමේන්තු කරන ලද ආදායම රු.25,000,000 ක් විය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ මත්පැන් බලපත්‍ර ගාස්තු ලෙස එකතු කරන ලද ආදායම රු.16,304,513 ක් පමණක් විය.

(ආ) පළාත තුළ ක්‍රියාත්මක වන, බලයලත් මත් පැන් බෙදාහරින්නන් පිළිබඳ විස්තර පළාත් සභාව සතුව නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, බලපත්‍ර ගාස්තු ගෙවීම පැහැර හරින ලද බෙදාහරින්නන්ට එරෙහිව පළාත් සභාවට කටයුතු කිරීමට නොහැකිවී තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් මත් පැන් බලපත්‍ර ගාස්තු ලෙස පළාත් සභාව විසින් කිසිදු මුදලක් රැස්කර ගෙන නොතිබු බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) ව්‍යවස්ථාපිත විධිවිධානවලට අනුව පළාත් පාලන බල ප්‍රදේශය තුළ පිහිටි උසාවි මඟින් පනවන ලද දඩ වලට අදාළව රැස්කිරීම් සහ දේපල පැවරීම්වලට අදාළව පනවන ලද මුද්දර ගාස්තු පළාත් පාලන ආයතන විසින් ඉල්ලීම් කර නොතිබීම හේතුවෙන් අදාළ පළාත් පාලන ආයතනවලට ප්‍රේෂණය කිරීමෙන් තොරව පළාත් සභාව විසින් රඳවා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් අදාළ පළාත් පාලන ආයතනවලට ප්‍රේෂණය කිරීමෙන් තොරව 2014 දෙසැම්බර් 31 දිනට පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ඉතිරි කිරීම් ගිණුම්වල රු.783,645,847 ක මුදලක් පැවතුණි.

(ඈ) වරිපනම්, කුලී, කල් බදු ආදී ප්‍රධාන ආදායම් ප්‍රභවයන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට හිඟව පැවතුණු එකතුව රු.522,113,354 ක් වූ ආදායම එකතු කර ගැනීම සඳහා නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන 44 ක් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| පළාත් පාලන ආයතනය | පළාත් පාලන ආයතන සංඛ්‍යාව | හිඟ මුළු මුදල |
|---|---|---|
| | | රු. |
| මහ නගර සභා | 3 | 181,318,598 |
| නගර සභා | 5 | 156,282,052 |
| ප්‍රාදේශීය සභා | 36 | 184,512,704 |
| එකතුව | 44 | 522,113,354 |

(ඉ) පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ට අදාළ රජයේ ඉඩම් සඳහා බදු කුලී ආදායම එකතුව රු.73,171,230 ක් 2009 වර්ෂයේ සිට 2015 ජුනි 30 දක්වා හිඟ ශේෂයන් ලෙස පැවතුණි. කෙසේ වුවද, එම හිඟ ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2015 ජුනි 30 දක්වා හිඟ ආදායම |
|---|---|
| | රු. |
| සමන්තුරෙයි | 513,975 |
| මුන්මුනෙයි උතුර | 48,538 |
| නගර හා කඩවත් සතර | 9,928,771 |
| කුච්චිවේලි | 62,679,946 |
| | 73,171,230 |

## 4. මූල්‍ය සමාලෝචනය

### 4.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, පළාත් සභා අරමුදලේ සමාලෝචිත වර්ෂය සඳහා රු.1,349,317,960 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.16,049,131 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.1,365,367,091 ක වර්ධනයක් දැක්වුණි.

### 4.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභාවේ මුළු වියදම රු.මිලියන 20,649 ක් වූ අතර, ඉන් රු.මිලියන 15,754 ක මුදලක් පුනරාවර්තන වියදම සඳහා දරා තිබුණි. එය මුළු වියදමෙන් සියයට 76 ක් නියෝජනය විය. මුළු පුනරාවර්තන වියදමෙන් රු.මිලියන 12,477 ක මුදලක් පුද්ගලික පඩිනඩි සඳහා දරා තිබූ අතර එය මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 79 ක් නියෝජනය විය. ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම රු.මිලියන 14,041 ක් වූ අතර එය එම වර්ෂය සඳහා මුළු වියදමෙන් සියයට 67 ක් නියෝජනය විය.

## 5. මෙහෙයුම් සමාලෝචනය

### 5.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 වර්ෂය සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්මට අනුව, නැගෙනහිර පළාත් සභාවේ විෂය පථය යටතට එන ආයතනවල නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ කාර්යක්ෂමතා කඩඉම් (EB) පරීක්ෂණ 22 ක් කොමිෂන් සභාව විසින් පැවැත්විය යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ පවත්වා තිබුණේ කඩඉම් පරීක්ෂණ 7 ක් පමණි.

(ආ) පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව විසින් නැගෙනහිර පළාතේ ලියාපදංචි ක්‍රීඩා සමාජ අතර බෙදාදීම සඳහා 2011 සිට 2013 දක්වා කාල පරිච්ඡේදය තුළ රු.1,122,903 ක වටිනාකමට ක්‍රීඩා ඇඳුම් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද මෙම ක්‍රීඩා ඇඳුම් විෂයයන් ක්‍රීඩා සමාජවලට බෙදාහැරීමෙන් තොරව 2015 ජනවාරි 26 වන විටත් ගබඩාවේ තබා තිබුණි.

(ඇ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) යටතේ අමාත්‍යාංශයකට හෝ දෙපාර්තමේන්තුවකට වෙන් කරන ලද අරමුදල් එය වෙන් කරන ලද කාර්යයන් සඳහා අදාළ අමාත්‍යාංශය හෝ

දෙපාර්තමේන්තුව විසින් උපයෝජනය කළ යුතුය. කෙසේ වුවද අම්පාර දිස්ත්‍රික්කයේ මීනොඩිකට්ටු සිට මුහතුවරම් දක්වා කාණු ඇළ මාර්ගය හැරීමට අදාළව කරන ලද කාර්යයන් සඳහා 2013 සිට 2014 දක්වා කාලය තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට වෙන් කරන ලද එකතුව රු.මිලියන 1.5 ක මුදල් එය වෙන් කරන ලද කාර්යය සඳහා යොදා ගැනීමෙන් තොරව දෙපාර්තමේන්තුව විසින් මධ්‍යම රජය යටතේ ක්‍රියාත්මක වන අම්පාර කලාපයේ වාරිමාර්ග අධ්‍යක්ෂවරයා විසින් ඉදිරිපත් කරන ලද වවුචරය ප්‍රතිපූර්ණය කිරීම සඳහා යොදා ගෙන තිබුණි.

## 5.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක වන වෛද්‍ය ආයතන 62 ක් විසින් තථ්‍ය අවශ්‍යතාවය සැලකීමෙන් තොරව කොළඹ වෛද්‍ය තාක්ෂණ හා සැපයුම් ආයතනය වෙතින් ඖෂධ අතිරික්තව ලබාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2010 සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ ලබාගෙන තිබූ රු.21,644,508 ක් වටිනා ඖෂධ කල් ඉකුත් වී තිබූ අතර එම කල් ඉකුත් වූ ඖෂධ 2015 අගෝස්තු 14 දක්වා ගබඩාවල තබා තිබුණි. විස්තර පහත දැක්වේ.

| **දිස්ත්‍රික්කය** | **වෛද්‍ය ආයතන සංඛ්‍යාව** | **කල් ඉකුත් වූ ඖෂධවල මුළු වටිනාකම** |
|---|---|---|
| | | රු. |
| ත්‍රිකුණාමලය | 12 | 6,168,640 |
| මඩකලපුව | 23 | 12,727,805 |
| අම්පාර | 27 | 2,748,063 |
| එකතුව | 62 | 21,644,508 |

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට රු.4,844,631 ක් වටිනා තත්ත්වයෙන් බාල ඖෂධ වර්ග 14 ක් මුතූර් මූලික රෝහලේ ගබඩාවල පැවතුණු අතර 2015 මාර්තු 09 දිනට රු.3,521,740 ක් වටිනා තත්ත්වයෙන් බාල ඖෂධ වර්ග 146 ක්ද, ත්‍රිකුණාමලය ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශයෙහි පැවතුණි. කෙසේ වුවද ත්‍රිකුණාමලය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් මේ සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2008 සිට 2011 දක්වා කාල පරිච්ඡේදය තුළ පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරුන් විසින් ලැප්ටොප් 37 ක් හා ෆැක්ස් යන්ත්‍ර 37 ක් ලබාගෙන තිබූ අතර ඉන් ලැප්ටොප් 12 ක් හා ෆැක්ස් යන්ත්‍ර 12 ක් 2012 ජුනි 27 දින පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසු ආපසු භාරදී තිබුණි. කෙසේ වුවද රු.4,524,250 ක් වටිනා ඉතිරි ලැප්ටොප් 25 ක් හා ෆැක්ස් යන්ත්‍ර 25 ක් 2015 අගෝස්තු 14 දක්වාත් ආපසු භාරදී නොතිබුණි.

(ඈ) 2008 සිට 2012 දක්වා කාල පරිච්ඡේදය තුළ හිටපු ප්‍රධාන අමාත්‍යවරයා හා ඔහුගේ පුද්ගලික කාර්ය මණ්ඩලයේ භාවිතය සඳහා ලී බඩු විෂයයන් 15 ක් හා ලැප්ටොප් , අයි පෑඩ්ස්, පුටු, පරිගණක, රූපවාහිනි, රූපවාහිනි ස්ටෑන්ඩ්, විධායක මේස, ප්‍රින්ටර්ස්, මේස විදුලි පංකා, පිනැකල් කාඩ්, පරිගණක සෙට් හා අල්මාරි ප්‍රධාන අමාත්‍ය ලේකම් කාර්යාලය විසින් සපයා තිබුණි. කෙසේ

වුවද , හිටපු ප්‍රධාන අමාත්‍යවරයාගේ නිල කාලය 2012 ජුනි 27 දින අවසන්වී තිබුණද, එම විෂයයන් 2015 අගෝස්තු 14 වන විටත් ආපසු භාරදී නොතිබුණි.

(ඉ) දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය (SHSDP) යටතේ 2014 වර්ෂය තුළ රු.87,456,500 ක වටිනාකමට වෛද්‍ය උපකරණ 58 ක් පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2006 - ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව වෛද්‍ය උපකරණ මිලදී ගැනීමට අදාළව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් (MPP) පිළියෙල කළ යුතුය. කෙසේ වුවද පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ii) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8 වගන්තිය අනුව භාණ්ඩවල වටිනාකම රු.මිලියන 1 ඉක්මවන්නේ නම් සැපයුම්කරු සමඟ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹිය යුතුය. කෙසේ වුවද ගිවිසුමකට එළඹීමෙන් තොරව දෙපාර්තමේන්තුව විසින් ඉහත සඳහන් වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය සිදුකර තිබුණි.

(iii) ලංසු ලියවිලිවල 6 වගන්තිය අනුව, ලංසු පිරිනැමූ දිනයේ සිට දින 30 ක් ඇතුළත සැපයුම්කරු විසින් වෛද්‍ය උපකරණ සැපයිය යුතුය. එසේ කිරීමට සැපයුම්කරු අසමත් වේ නම්, සතියකට සියයට 0.5 ක දඩ මුදලක් ගෙවීමට යටත් වේ. කෙසේ වුවද වෛද්‍ය උපකරණ 11 ක් දින 30 ක ප්‍රමාදයකින් පසුව සපයා තිබුණද, රු.428,352 ක් වූ දඩ මුදලක් සැපයුම්කරුවන්ගෙන් අයකර ගෙන නොතිබුණි.

(ඊ) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පශු සම්පත් ගොවිපොළ රු.576,660 ක මුළු වටිනාකමට ඖෂධ වර්ග 5 ක් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද පශු සම්පත් ගොවිපොළ විසින් එම ඖෂධ කල් ඉකුත් වීමට පෙර අදාළ කාර්යය සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. එබැවින් ඉහත සඳහන් ඖෂධ මිලදී ගැනීම සඳහා වැය කළ මුදල ඵල රහිත වියදමක් බවට පත්ව තිබුණි.

**5.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**--------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිලධාරීන් 18 දෙනෙකුට කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ රාජ්‍ය පරිපාලන උපාධි වැඩ සටහනක් හැදෑරීම සඳහා, එම උපාධි පාඨමාලා සම්පූර්ණ කිරීමට නිලධාරීන් අසමත් වුවහොත් උපාධි වැඩ සටහන සඳහා දරන ලද සියලුම වියදම් පළාත් සභාවට ප්‍රතිපූර්ණය කළ යුතුය යන කොන්දේසියක් සහිතව 2011 හා 2012 වර්ෂ තුළදී පළාත් සභාව විසින් අනුමැතිය ලබාදී තිබුණි. කෙසේ වුවද අධ්‍යයන පාඨමාලාව සම්පූර්ණ කිරීමට නොහැකි වූ නිලධාරීන්ගෙන් රු.380,000 ක මුදලක් අයකර ගැනීමට පළාත් සභාව විසින් පියවර ගෙන නොතිබුණි.

(ආ) දිළිඳු සිසුන් අතර බෙදාහැරීම සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් 29 දින රු.536,428 ක් වැය කරමින් සපත්තු හා පාසැල් බෑග් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) වෙනත් කාරණයක් සඳහා රාජ්‍ය නොවන සංවිධානයක් විසින් 2013 වර්ෂයේදී පිළියෙල කරන ලද සමීක්ෂණ වාර්තාවක් පදනම් කර ගෙන ඉහත සඳහන් සපත්තු ජෝඩු 263 ක් හා පාසැල් බෑග් 263 ක් මිලදී ගැනීම සිදුකර තිබුණි. කෙසේ වුවද අදාළ පාසැල්වල විදුහල්පතිවරුන්ගේ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ එකඟතාවය මේ සම්බන්ධයෙන් ලබාගෙන නොතිබුණි.

(ii) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගබඩාව විසින් පවත්වා ගෙන යන ඉන්වෙන්ට්‍රි ලේඛනයට අනුව ඉහත සඳහන් සපත්තු හා පාසැල් බෑග් 2014 දෙසැම්බර් 29 දින මිලදී ගෙන තිබූ අතර එම දිනයේදීම පාසැල් අතර බෙදාදී තිබුණි. කෙසේ වුවද අදාළ පාසැල්වල විදුහල්පතිවරුන්ගෙන් ලබාගත් ප්‍රකාශනවලට අනුව, එම සපත්තු සහ පාසැල් බෑග් 2015 ජූලි 23 දක්වාත් බෙදාදී නොතිබුණි.

(ඈ) නැගෙනහිර පළාතේ පාසැල් කිහිපයක් විසින් පාසැල්වල තත්ත්වය පවත්වා ගැනීමේ අරමුණින් අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම සඳහා දක්ෂතාවයක් නොදැක්වූ ශිෂ්‍යයින්ට විභාගයට පෙනී සිටීමට අවසර ලබාදී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කිසිඳු අධ්‍යාපනික සුදුසුකමක් නොමැතිව ශිෂ්‍යයින්ට පාසැල් හැර යාමට සිදුවී තිබූ අතර මෙම කරුණ අදාළ ශිෂ්‍යයින්ගේ උසස් අධ්‍යාපනයටද අයහපත් ලෙස බලපා තිබුණි. මේ සම්බන්ධයෙන් නිරික්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

| පාසැලේ නම | **2014 වර්ෂයේදී අ.පො.ස. (සා.පෙළ) පන්තියේ සිටි මුළු සිසුන් සංඛ්‍යාව** | **2014 අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා පෙනී සිටීමට අනුමත කළ මුළු සිසුන් සංඛ්‍යාව** | **2014 අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා පෙනී සිටීමට අනුමත නොකළ මුළු සිසුන් සංඛ්‍යාව** |
|---|---|---|---|
| ත්‍රි/කින්/සිරාජ් මධ්‍ය මහා විද්‍යාලය - කන්තලේ | 53 | 28 | 25 |
| ත්‍රි/කින්/අල් - අක්සා විද්‍යාලය | 111 | 97 | 14 |
| ත්‍රි/කින්/කින්නියා මධ්‍ය මහා විද්‍යාලය | 138 | 129 | 09 |
| ත්‍රි / නිලාවේලි කයිලෙස්වර විද්‍යාලය | 56 | 44 | 12 |
| ත්‍රි/මූ/අල් - හිලාල් මධ්‍ය කල්ලූරි | 45 | 36 | 09 |
| ත්‍රි/මූ/අල් - හිදායා මහා විද්‍යාලය | 53 | 37 | 16 |
| ත්‍රි/කින්/ අබ්දුල් මජීඩ් විද්‍යාලය | 12 | 09 | 03 |

**5.4 ද්‍රව්‍ය අක්‍රමිකතා**

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ගබඩා විෂයයන් සඳහා ගෙවීම් කිරීමේදී, සහතික කිරීමේ නිලධාරියා විසින් භාණ්ඩ ලැබුණු බවට හා අදාළ ඉන්වෙන්ට්‍රි ලේඛනයට හෝ තොග පොතට ඇතුළත් කළ බවට තහවුරු කර ගත යුතුය. කෙසේවුවද අදාළ ආයතන වලින් කිසිදු භාණ්ඩයක් ලැබීමෙන් තොරව වර්ෂය අවසානයට මුළු වටිනාකම රු.7,387,319 ක් වූ චෙක්පත් 49 ක් පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබුණි.

(ආ) විවෘත චෙක්පත් නිකුත් කිරීම තහනම් වුවද පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව විසින් මුළු වටිනාකම රු.272,070 කට විවෘත චෙක්පත් දෙකක් නිකුත් කර තිබුණි.

(ඇ) ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂගේ ළඟම ඥාතියෙකුට කොළඹ දක්වා ගමන් කිරීම සඳහා ක්‍රීඩා දෙපාර්තමේන්තුව විසින් එහි නිල වාහනයක් මුදාහැර තිබුණි. කොළඹ දක්වා ගමන් කිරීමේදී වාහනයේ එක් ටයරයකට හානිවීම හේතුවෙන් අදාළ පුද්ගලයා විසින් ටයර් 04 ම ආදේශ කර තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය. එබැවින් එම ටයර් මිලදී ගැනීම සඳහා කොළඹ පිහිටි ආයතනයකට රු.137,000 ක චෙක්පතක් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබුණි. කෙසේ වුවද, පළාත් අධ්‍යක්ෂගේ නියෝගය මත එම චෙක්පතේ ගෙවන්නාගේ නම වෙනස් කර තිබූ අතර එම චෙක්පත ත්‍රිකුණාමලය බැංකුවකින් මුදල් කර ගෙන තිබුණි.

## 5.5 අරමුදල් උපයෝජනය

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සෞඛ්‍ය අංශ සංවර්ධන වැඩ සටහනේ කාර්යයන් සිදුකිරීම සඳහා දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතියෙන් 2014 වර්ෂය තුළදී රු.180,000,000 ක් වූ අරමුදල් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් ලබාගෙන තිබුණි. ඉහත අරමුදලින් රු.36,686,574 ක මුදලක් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව තැන්පතු ගිණුම්වල තබා තිබුණි.

(ආ) සංවර්ධන කාර්යයන් සිදුකිරීම සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ එක් එක් පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා පළාත් සභාව විසින් අරමුදල් වෙන් කර තිබුණි. ඒ අනුව ග්‍රාමීය විදුලි බලය සැපයීම සඳහා 2014 වර්ෂය තුළදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පිළිවෙලින් රු.මිලියන 1 ක් හා රු.මිලියන 1.485 ක් ලබාගෙන තිබුණි. කෙසේ වුවද එම අරමුදල් වෙන්කරන ලද කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙන් තොරව වෙනත් කාර්යයක් සඳහා මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට මුදා හැර තිබුණි.

## 5.6 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් වාහන 15 ක් වර්ෂ 01 සිට 03 දක්වා කාල පරිච්ඡේදයක් සැපයුම් අංශයේ නිෂ්කාර්යව පැවතුණි. කෙසේ වුවද ඒවා අළුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසියකින් විකිණීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දැනුම් කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසැල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP) යටතේ රු.125,542,617 ක පිරිවැයකට නැගෙනහිර පළාතේ තෝරාගත් පාසැල් වල මහින්දෝදය රසායනාගාර 15 ක් ඉදිකර තිබූ අතර, 2014 වර්ෂය තුළ අදාළ පාසැල්වලට භාරදී තිබුණි. කෙසේ වුවද මෙම රසායනාගාර අතුරින්, දැනට රසායනාගාර 02 ක් පමණක් සිසුන් විසින් භාවිතා කරන අතර රු.108,203,113 ක පිරිවැයකට ඉදිකරන ලද ඉතිරි රසායනාගාර දහ තුන 2015 අගෝස්තු 14 වන විටත් උපයෝජනය කර නොතිබුණි. එසේම 2014 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම යටතේ රු.58,114,331 ක මුළු පිරිවැයකට රසායනාගාරවලට සපයන ලද ලී බඩු හා උපකරණද වර්ෂ 1 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි. තවද

රු.24,527,750 ක මුළු පිරිවැයකට 2014 වර්ෂය තුළදී මිලදී ගෙන ඉහත සඳහන් රසායනාගාර වලට ලබාදෙන ලද පරිගණක 325 ක් වර්ෂ 01 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවති බවද නිරික්ෂණය විය.

(ඈ) 2015 ජූලි 07 දින අඩ්ඩලච්චේනයි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ සිදුකරන ලද භෞතික පරික්ෂණයේදී රු.115,000 ක් වටිනා වෛද්‍ය උපකරණ 3 ක් අරමුණු කළ කාර්යය සඳහා යොදා ගැනීමෙන් තොරව වර්ෂ 1 කට වැඩි කාලයක් ගබඩාවේ තබා තිබුණි.

(ඇ) ප්‍රදේශයේ කෘෂිකාර්මික හා කිරි නිෂ්පාදනවලින් සියයට 30 ක් සඳහා අලෙවිකරණ පහසුකම් සැපයීමේ අරමුණින් රු.මිලියන 5.25 ක පිරිවැයකට 2012 වර්ෂයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අක්කරෙයිපත්තු, අලයඩිවෙම්බුහි විකුණුම් මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණි. කෙසේ වුවද මෙම මධ්‍යස්ථානය 2015 ජූලි 07 දක්වා එම කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණි. හිඟ ජල බිල්පත් ගාස්තු ලෙස රු.8,998 ක මුදලක් දෙපාර්තමේන්තුවට ගෙවීමට සිදුවී තිබූ බව තවදුරටත් නිරික්ෂණය විය. එහෙත් මෙම විකුණුම් මධ්‍යස්ථානය කිසියම් පුද්ගලයකු හෝ ආයතනයක් විසින් 2015 ජූලි 07 දක්වා භාවිතා කළ බවට තහවුරු කර ගැනීම සඳහා කිසිදු සාක්ෂියක් නොතිබුණි.

(ඉ) රටේ ප්‍රචණ්ඩත්වයට භාජනය වූ තැනැත්තන් සඳහා ආරක්ෂිත නේවාසික පහසුකම් සැලසීම වෙනුවෙන් ත්‍රිකුණාමලයේ ආරක්ෂක නිවාසයක් ස්ථාපිත කිරීම සඳහා 2012 වර්ෂයේදී සමාජ සේවා දෙපාර්තමේන්තුවට, "සරණාගතයන් සඳහා එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය" (UNHCR) විසින් රු.මිලියන 18 ක වටිනාකමට ගොඩනැඟිල්ලක් පරිත්‍යාග කර තිබුණු අතර 2013 වර්ෂයේදී මෙම ගොඩනැඟිල්ල සඳහා අවශ්‍ය උපකරණ "නෝර්වීජියානු සරණාගත කවුන්සිලය" (NRC) විසින්ද පරිත්‍යාග කර තිබුණි. කෙසේ වුවද මෙම ගොඩනැඟිල්ල සහ ගොඩනැඟිල්ලට සපයන ලද උපකරණ 2015 අප්‍රේල් 01 දින දක්වා අදාළ අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි. මෙම ආරක්ෂක නිවාසය කිසිදු කාර්යයකට යොදා ගෙන නොතිබුණද දෙපාර්තමේන්තුව විසින් රු.1,092,000 ක් වූ ආරක්ෂක සේවා ගාස්තු හා රු.48,200 ක් වූ විදුලි බල ගාස්තු මෙම ආරක්ෂක නිවාසය සඳහා 2013 මාර්තු 14 දින සිට ගෙවා තිබූ බවද තවදුරටත් නිරික්ෂණ විය.

(ඊ) 2013 වර්ෂයේදී සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් රු.මිලියන 1.99 ක පිරිවැයකට මුතූර්, අලෙයිනගර්හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) අධ්‍යාපන මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණි. කෙසේ වුවද මෙම මධ්‍යස්ථානය 2015 අගෝස්තු 04 දක්වාත් නිෂ්කාර්යව පැවතුණි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) මධ්‍යස්ථානයෙහි ස්ථාපිත කිරීම සඳහා රු.960,000 ක මුළු පිරිවැයකට 2014 වර්ෂයේදී මිලදී ගන්නා ලද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) උපකරණ හා උපාංග 2015 අගෝස්තු 04 දින දක්වාත් ස්ථාපිත කර නොතිබූ බව තවදුරටත් නිරික්ෂණය විය.

## 5.7 හඳුනාගන්නා ලද පාඩු

------------------------

පළාත් සභාවේ විෂය පථය යටතේ එන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඒවායේ වාහන අළුත් වැඩියා කිරීම සඳහා විශාල මුදලක් වැයකර තිබූ අතර අළුත් වැඩියා පිරිවැය ලෙස විශාල මුදලක් වැය කිරීමෙන් පසුව මෙම වාහන ඉවත් කර තිබුණි. නිරික්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) රු.මිලියන 8 ක පිරිවැයකට 2008 වර්ෂයේදී මිලදී ගන්නා ලද මාර්ග සංවර්ධන අමාත්‍යාංශයට අයත් වාහනයක් 2014 ඔක්තෝබර් 08 දින වැල්ලවායේදී අනතුරකට මුහුණ පා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය විසින් මෙම වාහනයට අදාළව දෛනික ධාවන වාර්තා හා මාසික සාරාංශ හෝ වෙනත් කිසිඳු වාර්තාවක් පවත්වා නොතිබුණි. එබැවින් අනතුරට පත්වන අවස්ථාවේදී වාහනයේ ගමන් කළ නිලධාරියාගේ නම සහ බැහැරයාමේ අරමුණ ආදී තොරතුරු ලබාගැනීමට නොහැකි විය.

(ii) පාඩුවක් හෝ හානියක් සිදුවූ වහාම, පාඩුවේ ප්‍රමාණය හා හේතුව නිශ්චය කර ගැනීමට හා වගකීම පැවරීම සඳහා මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව විමර්ශනයන් සිදුකළ යුතුය. කෙසේ වුවද විධිමත් පරික්ෂණයක් සිදුකර තිබුණේ අනතුර සිදුවූ දින සිට මාස 11 කින් පසුවය.

(iii) විමර්ශන මණ්ඩලයක් 2015 මාර්තු 31 දින පත්කර තිබුණද, පාඩුවේ ප්‍රමාණය හා පාඩුව සඳහා වගකීම පැවරීම තහවුරු කර ගෙන නොතිබුණි.

(iv) මෙම අනතුර සම්බන්ධයෙන් රක්ෂණ සමාගමට දැන්වීම අමාත්‍යාංශය විසින් ප්‍රමාද කර තිබූ හෙයින් රක්ෂණ ඉල්ලුම්පත භාර ගැනීම රක්ෂණ සමාගම විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. එබැවින් මෙම පාඩුව සඳහා වන්දි මුදලක් ලබාගැනීමට අමාත්‍යාංශයට නොහැකිවී තිබුණි.

(v) මෙම වාහනය අළුත් වැඩියා කිරීමට කටයුතු කිරීමෙන් තොරව අනතුර සිදුවූ දින සිට පුද්ගලික ගරාජයක ගාල් කර තිබුණි.

(ආ) රු.මිලියන 8 ක පිරිවැයකට 2008 වර්ෂයේදී මිලදී ගන්නා ලද කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් වාහනයක් 2013 මැයි 27 දින කොල්ලුපිටියේදී හා නැවත 2013 ජූලි 24 දින යක්කලදී අනතුරු වලට භාජනය වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). මුදල් රෙගුලාසි 103(1) ට අනුව මෙම වාහන අනතුරු සඳහා පොලිස් වාර්තාවක් ලබාගැනීමට ළඟම පොලිස් ස්ථානයට රියදුරු විසින් දන්වා නොතිබුණි.

(ii) පාඩුවක් හා හානියක් සිදුවූ වහාම පාඩුවේ ප්‍රමාණය හා හේතුව නිශ්චය කර ගැනීමට හා වගකීම පැවරීම සඳහා මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව විමර්ශනයන් සිදුකළ යුතුය. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් විමර්ශන මණ්ඩලයක් මේ දක්වා පත් කර නොතිබුණි.

(iii) මෙම වාහනය රු.මිලියන 8 ක මිලකට මිලදී ගෙන තිබුණද, වර්ෂ 6 ක කාල පරිච්ජේදය තුළ මෙම වාහනය අළුත් වැඩියා කිරීම සඳහා එකතුව රු.මිලියන 4.96 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වුවද විශාල මුදලක් අළුත්වැඩියා පිරිවැය ලෙස දැරීමෙන් පසුව මෙම වාහනය ගර්හිත කර තිබුණි.

## 5.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් රු.104,750 ක රේටයට සූර්ය බල ශක්ති පහන් ඒකක 10 ක් සපයා සවිකිරීම සඳහා සමාගමකට කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණු අතර අමාත්‍යාංශය විසින් පළාත්

නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) යටතේ වෙන්කරන ලද අරමුදල් වලින් 2014 වර්ෂය තුළදී එකතුව රු.1,047,500 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වුවද මාර්ග සංවර්ධන අමාත්‍යාංශය විසින්ද රු.165,000 ක රේටයට එම වර්ගයේම සූර්ය බල ශක්ති පහන් එම කාලපරිච්ජේදය තුළම සපයා සවි කිරීමට එම සමාගමට කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. එබැවින් අඩ්ඩලච්චේනයි, කෝනවත්ත හි සූර්ය බල ශක්ති පහන් ඒකක 21 ක් සවි කිරීම සඳහා රු.1,265,250 ක මුදලක් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය විසින් වැඩිපුර ගෙවා තිබුණි. එකම සමාගමට ඉහත සඳහන් කොන්ත්‍රාත් දෙක පිරිනැමීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ තාක්ෂණ ඇගයීම් කමිටුවේ සාමාජිකයකු ලෙස හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ තාක්ෂණ ඇගයීම් කමිටුවේ සාමාජිකයකු ලෙස එකම නිලධාරියා පත්කර තිබූ බව මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් නිරික්ෂණය විය.

(ආ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් රු.12,020,000 ක පිරිවැයකට 2010 වර්ෂයේදී අම්පාර කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ සඳහා කාර්යාල ගොඩනැඟිල්ලක් ඉදිකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම කාර්යාල ගොඩනැඟිල්ල ඉදිකරන ලද ඉඩම සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට පවරා ගෙන නොතිබුණි.

(ii) මෙම කාර්යාල ගොඩනැඟිල්ල ඉදිකිරීම ක්‍රියාත්මක කිරීමට පෙර දෙපාර්තමේන්තුව විසින් නාගරික සංවර්ධන අධිකාරියේ (UDA) දක්වා ඇති පරිපාටීන්ට අනුකූලවී නොතිබුණි. එබැවින් එය අනවසර ඉදිකිරීමක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය විසින් සලකා තිබුණි.

(iii) වගකිව යුතු නිලධාරින්ගේ නොසැලකිල්ල හේතුවෙන්, මෙම ගොඩනැඟිල්ල ඉදිකිරීමට පෙර අවශ්‍ය අනුමැතිය හා නිරවුල් කිරීමේ සහතික ලබාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරියෙන් පූර්ව අනුමැතිය ලබා නොගැනීම මත රු.1,009,800 ක වටිනාකමට සේවා ගාස්තුවක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් පනවා තිබූ අතර දෙපාර්තමේන්තුවට එරෙහිව නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවරා තිබූ නඩුව සම්බන්ධයෙන් නීතිඥ ගාස්තු ලෙස රු.16,000 ක මුදලක්ද ගෙවීමට සිදුවී තිබුණි

(iv) මෙම කාර්යාල ගොඩනැඟිල්ල ඉදිකිරීම සම්බන්ධයෙන් අම්පාර, නගර සභාවෙන් නිරවුල් කිරීමේ සහතිකයක් අම්පාර කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලා තිබුණි. කෙසේ වුවද පහත සඳහන් හේතුන් මත නිරවුල් කිරීමේ සහතිකය නිකුත් කිරීම නගර සභාව විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.

- මෙම ගොඩනැඟිල්ල මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග සීමාව ඇතුළත ඉදිකර තිබුණි.
- ආබාධිත පුද්ගලයන් සඳහා ප්‍රවේශ පහසුකම් සැපයීමෙන් තොරව මෙම ගොඩනැඟිල්ල ඉදිකර තිබුණි.

(v) මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග සීමාව ඇතුළත මෙම ගොඩනැඟිල්ල ඉදිකිරීම හේතුවෙන් රු.10,000 ක දඩ මුදලක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පනවා තිබුණි.

## 5.9 කාර්ය මණ්ඩල පරිපාලනය

----------------------------

පළාත් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

**(අ) පළාත් සභාවේ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු**

| | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,583 | 1,306 | 277 | - |
| තෘතියික මට්ටම | 1,750 | 1,458 | 292 | - |
| ද්විතියික මට්ටම | 24,873 | 24,910 | - | 37 |
| ප්‍රාථමික මට්ටම | 7,411 | 6,666 | 745 | - |
| | 35,617 | 34,340 | 1,314 | 37 |

**(ආ) පාසැල් කාර්ය මණ්ඩලය**

| දිස්ත්‍රික්කය | අනුමත සේවක සංඛ්‍යාව | | තථ්‍ය සේවක සංඛ්‍යාව | | අතිරික්තය | ඌනතාවය |
|---|---|---|---|---|---|---|
| | විදුහල්පතිවරු | ගුරුවරු | විදුහල්පතිවරු | ගුරුවරු | ගුරුවරු | විදුහල්පතිවරු |
| ත්‍රිකුණාමලය | 342 | 4,496 | 271 | 4,612 | 116 | 71 |
| මඩකලපුව | 425 | 5,585 | 306 | 5,668 | 83 | 119 |
| අම්පාර | 514 | 7,007 | 439 | 7,663 | 656 | 75 |
| එකතුව | 1,281 | 17,088 | 1,016 | 17,943 | 855 | 265 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 දෙසැම්බර් 31 දිනට මුතූර්, කින්නියා, මඩකලපුව බටහිර හා පදිරිප්පු කලාප අධ්‍යාපන කාර්යාලවල පැවතුණු මුළු අතිරික්ත ගුරුවරුන් සංඛ්‍යාව 235 ක් වූ අතර ත්‍රිකුණාමලය, ත්‍රිකුණාමලය උතුර හා කල්කුඩා කලාප අධ්‍යාපන කාර්යාලවල පැවතුණු මුළු ගුරු පුරප්පාඩු සංඛ්‍යාව 70 ක් විය. කෙසේ වුවද අතිරික්ත ගුරුවරුන් සිටින පාසැල්වලින් පුරප්පාඩු පවතින පාසැල්වලට ගුරුවරුන් මාරු කිරීම මඟින් පුරප්පාඩු පිරවීමට පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පියවර ගෙන නොතිබුණි.

(ii) 2014 දෙසැම්බර් 31 දිනට පළාත ඇතුළත විදුහල්පතිවරුන් සඳහා තිබූ පුරප්පාඩු සංඛ්‍යාව 265 ක් වූ අතර විදුහල්පතිවරුන් ලෙස කටයුතු නොකරන එහෙත් විදුහල්පති ශ්‍රේණිය හිමි මුළු නිලධාරීන් සංඛ්‍යාව 239 ක් විය. කෙසේ වුවද විදුහල්පතිවරු ලෙස කටයුතු නොකරන විදුහල්පති ශ්‍රේණිය හිමි නිලධාරීන් එම පාසැල් වලින් මාරු කිරීම මඟින් විදුහල්පති තනතුරු පුරප්පාඩු පිරවීමට පියවර ගෙන නොතිබුණි.

(iii) පහත සඳහන් අධ්‍යාපන කලාපවල ගණිතය, ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණය වැනි ප්‍රධාන විෂයයන් සඳහා අතිරික්ත හා ඌනතා පැවතියද පළාත තුළ අතිරික්ත කාර්ය මණ්ඩලය ඌනතා පැවති ස්ථානවලට යෙදවීම මඟින් තුලනය කිරීමට කටයුතු කර නොතිබුණි.

| අධ්‍යාපන කලාප | ඉංග්‍රීසි | | ගණිතය | | විද්‍යාව | | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | |
|---|---|---|---|---|---|---|---|---|
| | අතිරික්තය සංඛ්‍යාව | ඌනතාවය සංඛ්‍යාව | අතිරික්තය සංඛ්‍යාව | ඌනතාවය සංඛ්‍යාව | අතිරික්තය සංඛ්‍යාව | ඌනතාවය සංඛ්‍යාව | අතිරික්තය සංඛ්‍යාව | ඌනතාවය සංඛ්‍යාව |
| <u>ත්‍රිකුණාමලය</u> | | | | | | | | |
| ත්‍රිකුණාමලය | - | 31 | - | 28 | 08 | - | - | 08 |
| ත්‍රිකුණාමලය උතුර | - | 14 | - | 14 | - | 17 | 08 | - |
| මුතූර් | - | 70 | - | 36 | - | 09 | 04 | - |
| කින්නියා | - | 14 | - | 31 | 03 | - | - | 08 |
| <u>මඩකලපුව</u> | | | | | | | | |
| මඩකලපුව මධ්‍යම | - | 41 | - | 26 | 23 | - | - | 15 |
| මඩකලපුව බටහිර | - | 35 | - | 45 | - | 30 | - | 03 |
| කල් කුඩා | - | 46 | - | 54 | - | 21 | - | 14 |
| <u>අම්පාර</u> | | | | | | | | |
| කල්මුනෙයි | 06 | - | - | 08 | 65 | - | - | 26 |
| සම්මන්තුරෙයි | - | 39 | - | 08 | 27 | - | - | 04 |
| අක්කරෙයිපත්තු | 32 | - | - | 16 | 56 | - | - | 08 |
| තිරුක්කෝවිල් | - | 22 | 02 | - | 13 | - | - | 02 |

(ඇ) **සෞඛ්‍ය අංශ කාර්ය මණ්ඩලය**

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ (PDHS) හා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ (RDHS) සෞඛ්‍ය නිලධාරින්ගේ අතිරික්තයක් හා හිඟයක් පැවතුණි. කෙසේ වුවද පළාත ඇතුළත පුරප්පාඩු සේවක සංඛ්‍යාව සඳහා අතිරික්ත සේවක සංඛ්‍යාව යොදා ගැනීම මඟින් තුලනය කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| තනතුර | <u>ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය</u> | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | <u>අම්පාර</u> | | <u>කල්මුණේ</u> | | <u>මඩකලපුව</u> | | <u>ත්‍රිකුණාමලය</u> | |
| | අතිරික්තය සංඛ්‍යාව | ඌනතාවය සංඛ්‍යාව | අතිරික්තය සංඛ්‍යාව | ඌනතාවය සංඛ්‍යාව | අතිරික්තය සංඛ්‍යාව | ඌනතාවය සංඛ්‍යාව | අතිරික්තය සංඛ්‍යාව | ඌනතාවය සංඛ්‍යාව |
| හෙද නිලධාරි | - | 23 | 06 | - | - | 53 | - | 22 |
| මහජන සෞඛ්‍ය පරික්ෂක | - | 07 | 03 | - | - | 01 | - | 09 |
| මහජන සෞඛ්‍ය වින්නඹු | - | 25 | 03 | - | - | 18 | - | 20 |
| උපස්ථායක | - | 06 | - | 23 | - | 38 | 28 | - |
| කාර්යාල සහායක (SKS) (කනිෂ්ඨ) | 16 | - | 45 | - | 29 | - | - | 16 |

## 6. ගිණුම්කටයුතු භාවය හා යහ පාලනය

## 6.1 ක්‍රියාකාරී සැලැස්ම

පළාත් සභාව සහ පළාත් අමාත්‍යාංශ 05 ක් සහ පළාත් දෙපාර්තමේන්තු 28 ක් විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැසුම් පිළියෙල කර නොතිබුණි.

## 6.2 විගණන හා කළමනාකරණ කමිටුව

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට එක් වතාවක් හෝ රැස්විය යුතු යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තු 18 ක් විසින් එක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් හෝ පවත්වා නොතිබුණි.

## 6.3 ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2014 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන විසින් පිළියෙල කර නොතිබුණි.

## 6.4 නිරවුල් නොකරන ලද විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

මඩකලපුව දිස්ත්‍රික්කයේ රැකියා විරහිත තරුණයින් 250 කට කොරියන් භාෂාව ඉගැන්වීමේ පන්ති පැවැත්වීම සඳහා හිටපු ප්‍රධාන අමාත්‍ය ලේකම්වරයාට පළාත් අරමුදලින් අත්තිකාරමක් වශයෙන් 2008 වර්ෂයේදී රු.2,000,000 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද කොරියන් භාෂා පන්ති අපේක්ෂා කළ පරිදි පවත්වා නොතිබූ අතර ඉහත සඳහන් අත්තිකාරම 2015 අගෝස්තු 14 දක්වාත් අයකර ගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් විස්තරාත්මක හා ප්‍රවර්ධනාත්මක වාර්තාවක් මාසයක් ඇතුළත ඉදිරිපත් කිරීම සඳහා ප්‍රධාන අමාත්‍යවරයාගේ ලේකම්වරයාට 2013 ඔක්තෝබර් 14 දින පැවති එහි රැස්වීමේදී නියෝග කරන ලදි. එහෙත් එවැනි වාර්තාවක් 2015 මැයි 15 දක්වාත් කමිටුවට ඉදිරිපත් කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) ණයගැති හා ණයහිමි පාලනය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) වාහන උපයෝජනය
(ඊ) සේවක පරිපාලනය